# පූස් යාළුවෝ




තිසාරා අමන්දී ජයසේකර

# පුස් යාළුවෝ

කතා ප්‍රකාශනයකි
පළවන මුද්‍රණය 2025 පෙබරවාරි 08

කතාව සහ චිත්‍ර
තිසාරා අමන්දී ජයසේකර

2 ශ්‍රේණිය **B**

මහ / මහාමායා බාලිකා විදුහල

978-624-208-601-9

# පිදුම

මාගේ ආදරණීය
අම්මාටත් තාත්තාටත්
පාසලේ ආදරණීය
විදුහල්පතිනිය ඇතුළු
ගුරු මෑණිවරුන්ටත්
ගුරු පියවරුන්ටත්
මාගේ ආදරණීය අකුරු
කරන සොයුරියන්ටත්
මෙමෙ කතා පොත
ආදරයෙන් පුදමි.

# පෙරවදන

සාහිත්‍යය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි. ලක් ඉතිහාසයේ කෝට්ටේ, දඹදෙණි යුග කැපීපෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාලපරිච්ඡේද නිසාය. එසේ නම් මහාමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩ නගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්තකර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාව ම ඊට සම්බන්ධ කරගැනීමට අප ගත්කතුවරියන් සමත්වීම සුවිශේෂ සිදුවීමකි.
ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදි කතෘ කරඳන අත්ථදස්සි මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද ග්‍රන්ථකරණයට යොමුකරන **"හෙරණගත්කරණී"** ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.
මෙම ශාස්ත්‍රීය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇතිකරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි. ජීවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාව හඳුනාගනිමින් ලේඛන කරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සඳහා අත්වැලක් වනු නො අනුමානය.

විදුහල්පතිනිය,

ශශිකලා සේනාධීර,

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර.

# පූස් යාළුවෝ




එක කාලෙක ගෙදරක පූසෝ
දෙන්නෙක් හිටියා.
එක් කෙනෙක් දුඹුරුයි.



අනික් පූසා අළු පාටයි.



ඒ පූසො දෙන්නා යාළුයි.



දුඹුරු පූසා හොරෙන් කරවල කෑල්ලක් ගත්තා.
අළු පාට පූසා හොරකම් කරන්න හොඳ නැති බව කිව්වා.
දුඹුරු පූසා ආයෙත් හොරකම් කළේ නෑ.



දුඹුරු පූසා නිදි වෙලාවෙ පොඩි ළමයෙක් ඇවිල්ලා දුඹුරු පූසාව අල්ලා ගත්තා. පූසාට හුඟාක් රිදුණා. අළු පාට පූසා මේක දැක්කා. අළු පාට පූසා ළමයාව භය කළා. දුඹුරු පූසා ළමයාගේ අතින් බිමට පැනලා දිව්වා. ඔයාට ගොඩාක් ස්තුතියි දුඹුරු පූසා කිව්වා.




දුඹුරු පූසා සාලයේ සැප පුටුවක වාඩිවෙලා හිටියා. අම්මා දැක්කොත් දුඹුරු පූසාට ගුටිකන්න වෙන බව තේරුණ අළුපාට පූසා ඉක්මනට දුඹුරු පූසාව පුටුවෙන් බස්සලා බේරගත්තා.




දුඹුරු පූසා එක දවසක් එහා වත්තට ගියා. අළු පාට පූසා මේක දැකලා දුඹුරු පූසාට එහා වත්තට යන්න එපා කිව්වා. එහා වත්තේ දඩෝරියෙක් ඉන්නවා. එයා හරිම සැරයි.



දුඹුරු පූසා එක දවසක් පාරට ගියා. අළු පාට පූසා මේක දැක්කා. දුඹුරු පූසාට පාරට යන්න එපා කිව්වා. එයා වාහනවල හැපෙයි කියලා හිතුණු නිසා එහෙම කිව්වේ.



දුඹුරු පූසා යාළුවා කියන දේ ඇහුවා. දුඹුරු පූසා ආයෙත් නරක වැඩ කළේ නෑ. දුඹුරු පූසා ආයෙ හොරෙන් කරවල කෑවේ නෑ. දුඹුරු පූසා ආයෙ අළුපාට පූසාට හොරෙන් පාරට ගියේ නෑ. හොඳ වැඩ කරන්න පුරුදු වුණා.




අළු පාට පූසයි දුඹුරු පාට පූසයි සතුටින් යාළුකමින් ජීවත් වුණා. හොඳ යාළුවෝ තමන්ගේ යාළුවන්ව හොඳ වැඩ වලට යොමු කරනවා. අපිත් එහෙම වෙමු.

# පසුවදන



රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍යය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මාණකරණය විභවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩ නැගීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශිය සාහිත්‍ය කෙතේ රෝපණය කිරිමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ ඵලදායිතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි.

මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදි මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය, දියණියන්, ගුරුභවතුන්, දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරිමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය.

මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකිය. මානව දැනුම ගබඩාකර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත් සමඟ දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරි මෙන්ම සමාජය තුළ විවිධ ගැටලු ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මක ව සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනාකර ඩිජිටල් තාක්ෂණය යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාකෂණය සමග ගළපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමග එක්ව විද්‍යුත් කෘති රචනාකරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙනයාමට මහාමායා බාලිකාවයන් ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දි තිබේ තම නිසඟ, සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාෂිංසන.

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක,
සෙනෙවිරත්න මහලේකම්